## ජාතික ව්‍යාපාරය

ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය ආරම්භ වන්නේ 19 වන සියවස අවසාන භාගයේ ය. එය කොටස් දෙකකින් යුක්ත වේ. එනම් 19 වන සියවස අවසාන භාගයේ ආරම්භ වූ ජාතික පුනරුද ව්‍යාපාරය සහ 20 වන සියවස මුල් දශකයේ ඇරඹුණු ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ ව්‍යාපාරය යි.


> ස්වභාෂා උගතුන් ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයක් ඇති කිරීමට සංවිධානය වූ අතර, ඉංග්‍රීසි උගත් පිරිස දේශපාලන බලතල ඉල්ලා උද්ඝෝෂණය කළහ.

## ආගමික හා සංස්කෘතික පුනර්ජීවනය

බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට අධ්‍යාපන කටයුතු මෙහෙයවූයේ මිෂනාරි සමාගම් මඟිනි. ක්‍රිස්තියානි ආගම මෙරට ව්‍යාප්ත කරමින් ස්වදේශිකයන් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම මිෂනාරිවරුන්ගේ අරමුණ විය. ක්‍රිස්තියානි පූජකවරු දේශීය භාෂාවන් ඉගෙන එමඟින් මිෂනාරි පාසල්වල අධ්‍යාපන කටයුතු ගෙන ගියහ. ක්‍රිස්තියානි ධර්මය සිංහල හා දෙමළ භාෂාවෙන් ලියැවුණු පොත් පත් මුද්‍රණය කොට බෙදාහරින ලදී. මෙම ක්‍රියාවන් හේතු කොට ගෙන දේශීය ආගම් පිරිහී යාමේ තර්ජනයකට ලක් විය. ස්වභාෂා අධ්‍යාපනයට රජයෙන් ආධාර නොලැබුණ අතර මිෂනාරි පාසල්වලට රාජ්‍ය අනුග්‍රහය ලැබිණි. එබැවින් ස්වභාෂා පාසල් පිරිහී යන්නට විය. ඉංග්‍රීසින් යටතේ තම ආගම් හා සංස්කෘතීන්ට පහර වදින බව අවබෝධ කොට ගත් සිංහල, දෙමළ හා මුස්ලිම් යන ජන කොටස් 1860 පමණ වන විට තම ආගම් හා සංස්කෘතීන් නඟා සිටුවීම පිණිස විවිධ ව්‍යාපාර ආරම්භ කළහ.

19 වන සියවස අවසාන භාගය වනවිට බෞද්ධ ආගමික ප්‍රබෝධයක් ඇති කිරීමෙහි ලා පුරෝගාමී වූ භික්ෂූන් වහන්සේලා කිහිප නමක් වූහ. උන්වහන්සේලා අතර පහත සඳහන් නාහිමිවරු ප්‍රධාන වෙති.

- මිගෙට්ටුවත්තේ ගුණානන්ද නා හිමි - පංච මහා වාද මෙහෙය විය.
- හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමි - 1873 දී මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටු විය.
- රත්මලානේ ධර්මාලෝක නා හිමි - 1875 දී පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන පිහිටු විය.
- වලානේ සිද්ධාර්ථ නා හිමි - රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙන පිහිටු විය.



2.9 රූපය
මිගෙට්ටුවත්තේ ගුණානන්ද නා හිමි



2.10 රූපය
හික්කඩුවේ ශ්‍රී සුමංගල
නා හිමි

භික්ෂූන් වහන්සේගේ නායකත්වය යටතේ බෞද්ධ පුනර්ජීවනයක් ඇතිවන බව දුටු පාලකයෝ සහ ක්‍රිස්තියානි පූජකයෝ එම බලවේගය මැඩලීමට උත්සාහ ගත්හ. බුදුදහම පිළිබඳ ඔවුන්ට පැහැදිලි කොට දීම සඳහා පූජකවරුන් සමඟ නොයෙකුත් වාද විවාද කිරීමට ද භික්ෂූන් වහන්සේලාට සිදු විය.

- 1864- බද්දේගම
- 1865- වරාගොඩ
- 1866- උදම්මිට
- 1871- ගම්පොළ
- 1873- පානදුරය

ආදි ස්ථානවල පංච මහා වාද පැවැත්වීමෙන් ක්‍රිස්තියානි පූජකවරුන්ට අභියෝග එල්ල කළහ. මෙම වාද විවාද අතුරින් මිගෙට්ටුවත්තේ ගුණානන්ද නා හිමියන් විසින් පවත්වන ලද පානදුරාවාදය විශේෂයෙන් වැදගත් වේ. මෙම වාද විවාද නිසා රට තුළ බෞද්ධාගමික ප්‍රබෝධයක් ඇති වන්නට විය.

පානදුරාවාදය පිළිබඳ පුවත්පත්වලින් තොරතුරු දැනගත් ඇමරිකන් ජාතික හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමා බුදුදහම කෙරෙහි පැහැදී ශ්‍රී ලංකාවට පැමිණ බුදු දහම වැළඳ ගත්තේ ය. ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය විධිමත් කොට වැඩි දියුණු කිරීමට අවශ්‍ය පදනම දැමීමේ ගෞරවය එතුමාට හිමි වේ. 1880 දී ලංකාවට පැමිණි එතුමා පරම විඥානාර්ථ සමිතිය පිහිටුවා ඒ මඟින් බෞද්ධ පාඨශාලා පිහිටුවී ය. හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමන් විසින් කරන ලද සේවාවන් අතර,

- ගිහි පැවිදි දෙපක්ෂයටම පොදු සංවිධානයක් ලෙස පරම විඥානාර්ථ සමාගම පිහිටු වීම, ප්‍රධාන නගරවල එහි ශාඛා පිහිටු වීමට ක්‍රියා කිරීම

- බෞද්ධ අධ්‍යාපන අරමුදල ආරම්භ කොට එයට ආධාර එකතු කිරීම සඳහා රටපුරා සංචාරය කරමින් ජනතාව දැනුවත් කිරීම

- පරම විඥානාර්ථ බෞද්ධ සමාගම මඟින් ආනන්ද, නාලන්ද, ධර්මරාජ, මහින්ද ආදි බෞද්ධ පාසල් ආරම්භ කිරීම

- "සරසවි සඳරැස" පුවත්පත අරඹා එමඟින් බෞද්ධයන් එකමුතු කිරීම

- ඉරුදින දහම් පාසල් ඇරඹීම

- වෙසක් පෝය දින රජයේ නිවාඩු දිනයක් කරවා ගැනීමට දායක වීම

- කාන්තා අධ්‍යාපනය සඳහා විශාඛා විද්‍යාලය, මියුසියස් විද්‍යාලය වැනි බාලිකා විද්‍යාල ආරම්භ කිරීම යනාදිය වැදගත් වේ.



රූපය 2.11
හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා

දිවයිනේ බොහෝ ප්‍රදේශවල බෞද්ධ පාසල් පිහිටු වීම නිසා ලංකාවාසී බෞද්ධයන් තුළ ජාතිකානුරාගයක් ඇති වන්නට විය. එය සිංහල භාෂාව, සිරිත් විරිත් හා රටේ ඉතිහාසය පිළිබඳ මහත් ප්‍රබෝධයක් ඇති වීමට උපකාරි විය.


ඕල්කොට්තුමාගෙන් පසු බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ නායකත්වය ගත්තේ අනගාරික ධර්මපාල, වලිසිංහ හරිස්චන්ද්‍ර, ඩී. බී. ජයතිලක, ආතර් වී. දියෙස්, පියදාස සිරිසේන, අමදෝරිස් මෙන්ඩිස්, ආර්. ඒ. මිරැන්ඩෝ, ඩී. ඒ. හේවා විතාරණ වැනි තරුණ නායකයන් විසිනි.

එම නායකයන් අතුරින් ඕල්කොට්තුමාගේ ප්‍රධාන අනුගාමිකයකු වූ අනගාරික ධර්මපාලතුමා මේ අතර ප්‍රධාන වේ. විදේශ ආධිපත්‍යය නිසා විනාශ වී ගිය ජාතිකාභිමානය නැවත නඟා සිටු වීම සඳහා එතුමා මහත් පරිශ්‍රමයක් දැරී ය. ලංකාවේ පමණක් නොව විදේශ රටවලට පවා ගොස් බුදු දහමට ජාත්‍යන්තර කීර්තියක් ලබා දීමට ගත් උත්සාහය අතිශයින් ප්‍රශංසනීය වේ.



රූපය 2.12
ශ්‍රීමත් ඩී.බී. ජයතිලක

ඉන්දියාවේ බුද්ධගයාව බේරා ගැනීම සඳහා මහත් උනන්දුවෙන් කටයුතු කළ එතුමා බෞද්ධයන් තුළ ආත්ම විශ්වාසයෙන් යුතු අභිමානයක් ඇති කිරීමටත්, ජාතික හැඟීම් ඉස්මතු කිරීමටත් මහත් වෙහෙසක් ගත්තේ ය. 1891 දී අනගාරික ධර්මපාලතුමන් විසින් ආරම්භ කරන ලද මහාබෝධි සමාගම සහ 1898 දී ශ්‍රීමත් ඩී.බී. ජයතිලක මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කළ තරුණ බෞද්ධ සංගමය බෞද්ධ පුනරුද ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට උරදුන් ප්‍රබල සංවිධාන දෙකක් විය.



**රූපය 2.13**
**අනගාරික ධර්මපාලතුමා**



**රූපය 2.14**
**වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා**



**රූපය 2.15**
**පියදාස සිරිසේන මහතා**

## ශිෂ්‍ය ක්‍රියාකාරකම්

**ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධයක් ඇති කිරීමෙහිලා නායකත්වය ගත් සිංහල, දෙමළ, මුස්ලිම් නායකයන් පිළිබඳ තොරතුරු එක් රැස්කොට බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.**

**ශ්‍රී ලංකාවේ බෞද්ධ පුනර්ජීවනයක් ඇති කිරීමෙහිලා පුරෝගාමී වූ නායකයන් පිළිබඳ තොරතුරු එක් රැස් කොට කුඩා පොතක් නිර්මාණය කරන්න.**

## හින්දු පුනර්ජීවනය

ක්‍රිස්තියානි මිෂනාරි අධ්‍යාපනයෙන් එල්ල වූ අභියෝගයන්ට මුහුණ දීම පිණිස හින්දු භක්තිකයෝ ද සංවිධානය වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් හින්දු ආගමේ ද පුනරුද ව්‍යාපාරයන් ඇති වන්නට විය. ක්‍රිස්තියානි මිෂනාරි සමාගම් විසින් පවත්වා ගෙන ගිය පාසල් මඟින් ලබා දුන් අධ්‍යාපනය නිසා හින්දු සංස්කෘතිය හා පාරම්පරික සිරිත් විරිත් විනාශ වී යනු ඇතැයි බියක් ඇති වූයෙන් හින්දු භක්තිකයන් අතර මිෂනාරි අධ්‍යාපනයට විරුද්ධ ව්‍යාපාර බිහි වන්නට විය. ආරුමුග නාවලර් තුමා (1822-1897) එම හින්දු පුනර්ජීවන ව්‍යාපාරයේ නායකත්වය දැරී ය.



රූපය 2.16
ආරුමුග නාවලර්තුමා

ක්‍රිස්තියානි අධ්‍යාපනයක් ලබා සිටි නාවලර්තුමා පර්සිවල් නම් දේවගැතිවරයා සමඟ එක්ව බයිබලය දෙමළ භාෂාවට පරිවර්තනය කෙළේ ය. පසු කාලයේ හින්දු ආගමට පහර දෙමින් ද ක්‍රිස්තියානි මිෂනාරිවරුන් විසින් ගෙන ගිය ප්‍රකාශන වලට පිළිතුරු දෙමින් ද හින්දු ආගම ආරක්ෂා කිරීම සඳහා නාවලර්තුමා මහත් වෙහෙසක් ගෙන කටයුතු කෙළේ ය. සිය ජාතිකයන්ගේ ශ්‍රේෂ්ඨ උරුමයන් පිළිබඳවත්, හින්දු ආගමේ වැදගත්කම විදහා දැක්වීමටත් කටයුතු කළ එතුමා 1897 දී යාපනයේ වණ්ණාර්පණ්ණෙයි හි ඉංග්‍රීසි පාසලක් ආරම්භ කෙළේ ය. පසු කාලයේ දී එය හින්දු විද්‍යාලය නමින් ප්‍රසිද්ධ විය. 1853 ආරම්භ කළ ශෛව පරිපාලන සභාව සහ හින්දු අධ්‍යාපන සභාව හින්දු ජනතාව අතර ප්‍රබෝධයක් ඇති කිරීමට මහත් පිටුවහලක් විය.




රූපය 2.17
පොන්නම්බලම් රාමනාදන් මහතා

ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් ද හින්දු ආගමික පුනර්ජීවනයෙහි ලා මහත් සේවාවක් කළ අයෙකි. ඔහු ද්‍රවිඩ ජනතාව අතර පමණක් නොව සිංහල ජනතාව අතර ද ජනාදරයට පත් වූ නායකයෙකි. 1910 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල දී උගත් ලාංකිකයන්ගේ ඡන්දයෙන් නියෝජිතයකු පත් කර ගැනීමේ අවස්ථාවේ දී බහුතරය වූ සිංහල ඡන්ද දායකයින්ගේ ද ඡන්දය ලබා ගෙන සිංහල අපේක්ෂකයා පරාජය කොට එම අසුන දිනා ගැනීමට ඔහු සමත් විය. 1915 සිංහල - මුස්ලිම් කෝලාහල සමයේ දී නඩු විභාගයකින් තොරව සිරභාරයට ගත් සිංහල ජනනායකයන් නිදහස් කර ගැනීමේ ව්‍යාපාරයේ දී ඔහු මහත් කැපවීමකින් කටයුතු කෙළේ ය.

පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් පරමේශ්වර විද්‍යාලයත්, රාමනාදන් විද්‍යාලයත් පිහිටුවන ලද මෙතුමා ගෙන් හින්දු ප්‍රබෝධය උදෙසා සිදු වූ සේවය ඉතා වැදගත් වේ.

# ඉස්ලාම් පුනර්ජීවනය



රූපය 2.18
එම්.සී සිද්දි ලෙබ්බේ මහතා

ශ්‍රී ලංකාවේ සිංහල හා හින්දු පුනර්ජීවනයක් ඇති වීම හා සමගාමීව මුස්ලිම් ජනයා අතර ද සංස්කෘතික ප්‍රබෝධයක් ඇති වන්නට විය. ඔවුන් අතර සිය ආගම සහ භාෂාව කෙරෙහි අභිමානයක් හා ප්‍රබෝධයක් ඇති කිරීමෙහි ලා පුරෝගාමී වූයේ එම්. සී. සිද්දි ලෙබ්බේ මහතා ය. මුස්ලිම් ජනතාව තුළ අධ්‍යාපන කටයුතු පිළිබඳව එතරම් උනන්දුවක් නොතිබූ යුගයක ඔවුන් තුළ අධ්‍යාපනය පිළිබඳ පිබිදීමක් ඇති කිරීමට එතුමාගේ ක්‍රියා කලාපය බොහෝ දුරට හේතු විය.

අරාබි භාෂාව ඉගෙනීම සඳහා මුස්ලිම් ජනතාව උනන්දු කළ ඔහු ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට ද මුස්ලිම් ජනතාව උනන්දු කෙළේ ය. ඔහු "මද්රාසා" නම් වූ මුස්ලිම් ආගමික පාසල් ප්‍රතිසංවිධානය කිරීමට කටයුතු කෙළේ ය. 1882 දී මරදානේ සහිරා විද්‍යාලය ආරම්භ වූයේ ද සිද්දි ලෙබ්බේ මහතාගේ නායකත්වයෙනි. මුස්ලිම් බාලිකාවන් සඳහා ද මහනුවර පාසලක් ආරම්භ කිරීමෙහි පුරෝගාමී වූ සිද්දි ලෙබ්බේ මහතා, කොළඹ මුස්ලිම් අධ්‍යාපන සංගමය පිහිටුවීමේ දී ද පුරෝගාමී මෙහෙවරක් ඉටු කෙළේ ය.

දේශීය ආගම්, භාෂාව හා සංස්කෘතිය පිරිහී යන යුගයක දේශීය සංස්කෘතිය නඟා සිටුවීමේලා පුරෝගාමී වී මුස්ලිම් ජනතාව තුළ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධයක් ඇති කිරීමට කටයුතු කළ සිද්දි ලෙබ්බේ මහතාගෙන් මෙරට ජාතික ව්‍යාපාරයට ලැබුණ අනුග්‍රහය ඉතා වැදගත් වේ.

ටී. බී. ජයා මහතා ද මුස්ලිම් අධ්‍යාපන සහ සංස්කෘතික නවෝදයට දායක වූ ප්‍රධානියෙකි. 1914 දී ආරම්භ කළ සිලෝන් මුස්ලිම් රිවීව් සඟරාවට සපයන ලද ලිපි මඟින් ඔහු මුස්ලිම් ජනතාවට අධ්‍යාපනයේ වැදගත්කම පැහැදිළි කිරීමට පියවර ගෙන ඇත. ඔහු මුස්ලිම් අධ්‍යාපනයට කරන ලද අමරණීය සේවයේ ජීවමාන සාධකය වන්නේ සහිරා විද්‍යාලය යි. සිද්දි ලෙබ්බේ මහතා ආරම්භ කළ සහිරා විද්‍යාලය පිරිහෙමින් පැවති බැවින් 1921 දී එහි විදුහල්පති තනතුර භාර ගෙන එය නඟා සිටුවීමට ටී. බී. ජයා මහතා අති මහත් කැපකිරීමකින් සේවය කෙළේ ය. 1936 - 1947 දක්වා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නම් කළ මන්ත්‍රීවරයකු වශයෙන් ද, 1947 ප්‍රථම පාර්ලිමේන්තුවේ කම්කරු හා සමාජ සේවා ඇමති වශයෙන් ද ඔහු දිගින් දිගට ම මුස්ලිම් ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කෙළේ ය.

ආගමික පුනරුදයක් ඇති වීමත් සමඟ ශ්‍රී ලංකාවේ සංස්කෘතික පුනරුදයකට ද මඟ පෑදිණි. සිංහල, පාලි සංස්කෘත ආදී පොත් පත් රැසක් මුද්‍රණය වූයේත් සිංහල පුවත් පත් රැසක් ආරම්භ වූයේත් මෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

පහත දැක්වෙන්නේ ඉන් පුවත්පත් කිහිපයකි

- ක්‍රි.ව. 1862 -''ලක්මිණි පහන්,''ලක්මිණි කිරණ'' හා''අරුණෝදය''යන පුවත්පත් පළ විය.
- ක්‍රි.ව. 1866 -''ඥානාර්ථ ප්‍රදීපය''ආරම්භ කිරීම මෙය දැනට පවත්නා පැරණි ම සිංහල පුවත්පත වේ.
- ක්‍රි.ව. 1880 -''සරසවි සඳරැස''පුවත්පත ආරම්භ කෙරිණි.
- ක්‍රි.ව. 1902 - ''සිංහල ජාතිය''පුවත්පත - පියදාස සිරිසේන මහතා විසින් ආරම්භ කරන ලදි.
- ක්‍රි.ව. 1909 -''දිනමිණ''පුවත්පත ප්‍රකාශයට පත් කෙළේ ඩී.ආර්. විජේවර්ධන මහතා විසිනි.

සංස්කෘතික පුනරුදයක් ඇති වීමට බලපෑ සාධක කිහිපයක් පහත දැක්වෙන ආකාරයට පෙළගැස්විය හැකි ය.

- ආගමික හා සංස්කෘතික සිද්ධීන් අනුසාරයෙන් නාට්‍ය නිර්මාණය කිරීම හා ප්‍රදර්ශනය කිරීම.
- පියදාස සිරිසේන, ඩබ්ලිව්.ඒ. සිල්වා වැනි ලේඛකයන් ජාතිකාභිමානය ඔප් නැංවෙන ආකාරයේ නවකථා රචනා කිරීම.
- ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් කාව්‍යකරණය මඟින් සිංහල ජනයා තුළ ජාතිකානුරාගය ඇති කිරීමට ක්‍රියා කිරීම.
- විද්‍යෝදය සහ විද්‍යාලංකාර වැනි මහ පිරිවෙන් මඟින් පාලි හා සංස්කෘත වැනි භාෂා ඉගැන්වීම සහ එම පිරිවෙන් අනුගමනය කරමින් දිවයිනේ විවිධ ප්‍රදේශවල බෞද්ධ අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම.
- ''පරම විඥානාර්ථ බෞද්ධ සමාගම''මඟින් දහම් පාසල් ආරම්භ කිරීම.
- ''තරුණ බෞද්ධ සංගමය''මඟින් තවදුරටත් දහම් පාසල් ඉදිරියට ගෙන යාම.
- ආරුමුග නාවලර්, පොන්නම්බලම් අරුණාචලම්, පොන්නම්බලම් රාමනාදන් වැනි ජන නායකයන් අනුගමනය කළ ක්‍රියාමාර්ග නිසා හින්දු සංස්කෘතික ප්‍රබෝධයක් ඇති වීම.
- හින්දූන් විසින් 1888 දී "ඉන්දුසාදනම්" සහ 1930 වීරකේසරි පුවත්පත ද 1931 දී තිනකරන් පුවත්පත ද ආරම්භ කිරීම.
- මුස්ලිම් නායකයන් විසින් ''මුස්ලිම් නේෂන්'' සහ ''ඥානදීපම්'' පුවත්පත් ආරම්භ කිරීම.


දේශීය සංස්කෘතිය පිරිහෙමින් පැවති යුගයක මෙම ස්වභාෂා උගතුන් විසින් බටහිර සභ්‍යත්වයට සහ මිෂනාරී කටයුතුවලට එරෙහිව ගෙන ගිය ක්‍රියා කලාපය නිසා නැවත දේශීය සංස්කෘතියේ නැඟී සිටීමක් සිදු විය.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම්**

- ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික පුනරුදයක් ඇති වීමට හේතු වූ කරුණු මැයෙන් සිංහල බෞද්ධ පුවත් පතකට ලිපියක් සකස් කරන්න.
- 19 වන සියවසේ අගභාගයේ ජාතික ව්‍යාපාරයේ දී මුල් වී ක්‍රියා කළ ප්‍රධාන පුද්ගලයන් 10 දෙනෙකු පිළිබඳ තොරතුරු ඇතුළත් කුඩා පොතක් සකස් කරන්න.

## අමද්‍යප ව්‍යාපාරය

ජාතික පුනරුද ව්‍යාපාරයේ සංස්කෘතික නවෝදයට මෙන් ම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ ව්‍යාපාරයට ද විශාල දායකත්වයක් සැපයූ ව්‍යාපාරයක් ලෙස අමද්‍යප ව්‍යාපාරය දැක්විය හැකි ය. 20 වන සියවස වනවිට ඉංග්‍රීසීන් විසින් ක්‍රියාත්මක කළ මත්පැන් ප්‍රතිපත්තිය නිසා රට පුරා බීමත්කම පැතිර ගොස් සංස්කෘතික විනාශයක් ඇති වන බව දක්නට ලැබිණි. ඒ අනුව දේශීය නායකයෝ ඊට විරුද්ධව කටයුතු කරන්නට වූහ. 1911 න් පසු ඉංග්‍රීසි ආණ්ඩුව ආදායම් වැඩිකොට ගැනීම සඳහා සුරාසල් වැඩි වැඩියෙන් විවෘත කිරීම නිසා මත්පැන් උවදුර පිළිබඳ බිය තවත් වැඩි වන්නට විය. 1912 නව සුරාබදු පනතක් නීති ගත කිරීම නිසා එය සමාජ උවදුරක් ලෙස සලකා ඊට විරුද්ධ ව උද්ඝෝෂණ ව්‍යාපාරයක් ආරම්භ කෙරිණි. අමද්‍යප ව්‍යාපාරය නමින් හැඳින් වූ එහි නායකත්වය ගත්තෝ ඩී.සී. සේනානායක, එෆ්.ආර්. සේනානායක, ඩී. එස්. සේනානායක, අනගාරික ධර්මපාල, එඩ්මන්ඩ් හේවාවිතාරණ, ශ්‍රීමත් ඩී.බී. ජයතිලක, ඩබ්ලිව්.ඒ.ද. සිල්වා, පියදාස සිරිසේන, ආතර් වී. දියෙස් වැනි ස්වභාෂා උගත් ප්‍රභූවරු ය. එම ව්‍යාපාරයට බිය වූ බ්‍රිතාන්‍ය පාලකයන් එයට විරුද්ධව අනුගමනය කළ ක්‍රියාමාර්ග හේතු කොට ගෙන අමද්‍යප ව්‍යාපාරය පසුව පුළුල් ජාතික ව්‍යාපාරයක් බවට පත් විය. දේශපාලන අරමුණු මුල්කොට ගත් සංවිධානයක් නොවුණ ද අමද්‍යප ව්‍යාපාරයට ජාතික නායකයන් ඒකරාශි කළ හැකි විය. එම ව්‍යාපාරය තුළින් බෞද්ධ නායකයන්ට ජාතික නායකත්වයට පත් වීමට අවස්ථාව ලැබිණි. පසු කාලයේ දී අමද්‍යප නායකයෝ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට එකතු වී එයට කැපී පෙනෙන දායකත්වයක් සැපයූහ.



රූපය 2.19
එෆ්. ආර්.
සේනානායක මහතා

19 වැනි සියවසේ අගභාගයේ සිට ක්‍රියාත්මක වූ ආගමික හා සංස්කෘතික පුනර්ජීවන ව්‍යාපාරයත් එයට ම සම්බන්ධ වී 20 වැනි සියවස මුල් කාලයේ ක්‍රියාත්මක වූ අමද්‍යප ව්‍යාපාරයත් මඟින් බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව දේශීය ජනතාව ගතයුතු නිවැරදි මාර්ගය පෙන්වා දෙන ලදී. බ්‍රිතාන්‍ය පාලකයන් මේ රටින් පලවා හැරීමේ දී නිදහස සහ ස්වෛරී අනන්‍යතාව යළි ගොඩ නඟා ගත යුතු බව මෙහිදී අවධාරණය කෙරිණි. ඒ සඳහා දේශීය ආගම් අනුව හැඩ ගැසුණු සාරධර්මවලින් පරිපූර්ණ සමාජ සංස්කෘතික


නොමිලේ බෙදාහැරීම සඳහා ය

රටාව යළි ගොඩ නඟා ගත යුතු බවත්, එය කළ යුතු ආකාරයත් ස්වභාෂා උගතුන් විසින් ක්‍රියාත්මක කරන ලද පුනර්ජීවන ව්‍යාපාරය මඟින් පෙන්වා දෙන ලදී. එහෙත් පසුව අපට දක්නට ලැබෙන පරිදි ජාතික ව්‍යාපාරය ලෙස ඉංග්‍රීසි උගතුන් ක්‍රියාත්මක කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ ව්‍යාපාරය එම මඟ පෙන්වීම පිටු දැකීම නිසා 1948 නිදහස ලබා ගැනීමෙන් පසුවත් අපට පූර්ණ නිදහස ලැබී නැති බව පැහැදිලි වෙමින් පවතී.